# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.07.07 පැය 0750 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1350/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීමක් සම්බන්ධ තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.07.06 වන දින දහවල් කාලයේ හිරණ පොලිස් වසමේ හිරණ පානදුර මාගර්යේ තේක්කවත්ත හන්දියේදී පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් පානදුර උප කඳවුරේ යතුරුපැදි කණ්ඩායමක් සමඟ ඒකාබද්ධ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 310 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු යතුරුපැදියක්ද සමඟ** අත්අඩංගුවට ගෙන හිරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන හිරණ, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හිරණ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා මත්කරල් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කළුබෝවිල කඳවුර.**

2025.07.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කළුබෝවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොහුවල පොලිස් වසමේ කළුබෝවිල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් **මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 840 ක් හා මත්කරල් 600 ක් සමග සැකකාරියක්** අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 49 ක් වන කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොහුවල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2025.07.06 වන දින සවස් කාලයේ මීගහතැන්න පොලිස් වසමේ ලිලිනාවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් හා මීගහතැන්න පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ඒකාබද්ධ වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 22 මිලි ලීටර් 500 ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 360 ක් සහ මත්පැන් පෙරීමට යොදා ගන්නා උපකරණ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන මහකළුපහන, මතුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගහතැන්න පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධී දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.

2025.07.06 වන දින දහවල් කාලයේ මදුරන්කුලිය පොලිස් වසමේ විරුතෝඩෙයි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද නීති විරෝධී දුම්වැටි 2200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මදුරන්කුලිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන විරුතෝඩෙයි, මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**